කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි දෙවන වසර පරීක්ෂණය (බාහිර) -2021

2024 – මාර්තු

**BCOM E 2055 - සාර්ව ආර්ථික විද්‍යාව**

ප්‍රශ්න සංඛ්‍යාව : (හයයි) 06
ඕනෑම ප්‍රශ්න පහකට (05) කට පිළිතුරු සපයන්න. කාලය : පැය 03 යි

---

**ප්‍රශ්ණ අංක 01**

අ. රටක ආර්ථික කාර්ය සාධනය මැනීම සඳහා බහුලව භාවිතා වන ප්‍රධාන සාර්ව ආර්ථික විචල්‍යයන් සාකච්ඡා කරන්න.

(ලකුණු 05)

ආ. පශ්චාත් වසංගත කාලපරිච්ඡේදය තුළ ශ්‍රී ලංකා ආර්ථිකය මුහුණ දුන් අභියෝග සහ අවස්ථා සාකච්ඡා කරන්න.

(ලකුණු 05)

ඇ. ඔබ ආර්ථික අවපාතයක් අත්විඳින රටක රජයේ ආර්ථික උපදේශකයෙකු යැයි සිතන්න. ආර්ථික වර්ධනය උත්තේජනය කිරීම සහ විරැකියාව අවම කිරීම සඳහා නිර්දේශ ලබා දෙන ලෙසට රජය ඔබගෙන් ඉල්ලා ඇත. අවම වශයෙන් නිර්දේශ පහක් යෝජනා කරන්න.

(ලකුණු 10)
(මුළු ලකුණු 20)

**ප්‍රශ්ණ අංක 02**

අ. වෘත්තාකාර ප්‍රවාහ ආකෘතිය භාවිතා කරමින්,ආර්ථිකයට රජයේ වියදම් වැඩිවීම ආර්ථිකයකට බලපෑම කරන ආකාරය විශ්ලේෂණය කරන්න.

(ලකුණු 06)

ආ. කේන්සියානු ආදායම් නිර්ණය කිරීමේ ආකෘතියෙහි මූලික ප්‍රධාන උපකල්පන පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ඇ. "ශ්‍රී ලංකාව අවපාත පරතරයක් අත්විඳිමින් සිටින තත්වයක් තුළ එහි සැබෑ නිමැවුම විභව නිමැවුමට වඩා අඩු මට්ටමක පවතී" කේන්සියානු න්‍යාය භාවිතා කරමින්, අවපාත පරතරය ජය ගැනීමට සහ ආර්ථික වර්ධනය සීඝ්‍ර කිරීමට රජයට ෆිස්කල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කළ හැකි ආකාරය සාකච්ඡා කරන්න.

(ලකුණු 08)
(මුළු ලකුණු 20)

ප්‍රශ්ණ අංක 03

අ. ISLM ආකෘතිය සහ එහි ප්‍රධාන කොටස් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ආ. රජයේ වියදම් හා බදු වෙනස්වීම් සමස්ත ඉල්ලුම නිමැවුම සහ පොලී අනුපාතයට බලපාන්නේ කෙසේද ? IS-LM ආකෘතිය භාවිතයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ඇ. උපකල්පිත ආර්ථිකයක් සඳහා පහත ආර්ථික ශ්‍රිතයන් ඔබට ලබා දී ඇත.

පරිභෝජන (C) = 400 + 0.80 (Y- 120)

ආයෝජන (I) = 160-20r

රජයේ වියදම් (G) = 150

මුදල් ඉල්ලුම ($M^d$) = 0.25Y- 6r

මුදල් සැපයුම (MS) = 120

i. IS-LM ආකෘතිය භාවිතයෙන් සමතුලිත ආදායම ගණනය කරන්න.

ii. රජය අධ්‍යාපන සහ සෞඛ්‍ය සේවාවන් සඳහා කරන වියදම් මිලියන 200 කින් වැඩි කරනවා යැයි සිතමු. සමතුලිත ආදායම කෙරෙහි එහි බලපෑම කුමක් ද?

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

ප්‍රශ්ණ අංක 04

අ. ආර්ථිකයකට ෆිස්කල් හා මූල්‍ය ප්‍රතිපත්තිවල වැදගත්කම පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ආ. අවපාත කාලපරිච්ඡේදයකදී ආර්ථික වර්ධනය කරායාමේදී ප්‍රසාරණාත්මක ෆිසිකල් ප්‍රතිපත්තියේ සඵලතාවය විස්තර කරන්න.

(ලකුණු 06)

ඇ. ශ්‍රී ලංකා ආර්ථිකයක මුහුණ දෙනු ලබන සාර්ව ආර්ථික අභියෝග විසදීමේදී මූල්‍ය ප්‍රතිපත්ති අධ්‍යයනය කිරීමේ වැදගත්කම පැහැදිලි කරන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 20)

ප්‍රශ්ණ අංක 05

අ. ශ්‍රී ලංකාවේ වර්තමාන උද්ධමනකාරි තත්වයට බලපා ඇති ප්‍රධාන හේතු මොනවාද ?

(ලකුණු 05)

ආ. ශ්‍රී ලංකාවේ දැනට පවතින උද්ධමන අනුපාතය පාලනය කිරීම සඳහා භාවිතා කළ හැකි පිළියම් මොනවාද යන්න පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ඇ. විරැකියාව සහ උද්ධමනය අතර පිලිප්ස් වක්‍ර සම්බන්ධතාව සාකච්ඡා කරන්න.

ප්‍රතිපත්ති සම්පාදකයින්ට මෙම ආර්ථික දර්ශන දෙක අතර ගනුදෙනුව තේරුම් ගැනීමට මෙම සබඳතාව උපකාර වන්නේ කෙසේද ?

(ලකුණු 10)
(මුළු ලකුණු 20)

ප්‍රශ්ණ අංක 06

අ. ආර්ථිකයක අයවැය හිඟය පියවා ගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ආ. අනාගත පරම්පරාව සඳහා ශ්‍රී ලංකාවේ රජයේ ණය සමුච්චය වීමේ ප්‍රතිවිපාකයන්හි බලපෑම සාකච්ඡා කරන්න.

(ලකුණු 07)

ඇ. අයවැය සමතුලනය පිළිබඳ සංකල්පය සහ ෆිසිකල් තිරසාරභාවය සඳහා එහි වැදගත්කම සාකච්ඡා කරන්න.

(ලකුණු 08)
(මුළු ලකුණු 20)